ලංකා
... පුස්තකාල සේවා මණ්ඩ...
...නායකතී.

# පුස්තකාල ප්‍රවෘත්ති

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

**LIBRARY NEWS** 1981 JULY/SEPTEMBER நூலகச் செய்தி

● දෙවන කාණ්ඩය ● අංක: 3 ● VOLUME: 2 NO: 3

## ගුරු පුස්තකාලයාධිපතීන්...

# [illegible]

නොබෝද්ධ අධ්‍යාපන සේවා අමාත්‍යාංශයේ පාසල් පුස්තකාල සංවර්ධන අංශයේ ප්‍රධානත්වයෙන් පුස්තකාල සේවා මණ්ඩලයේ සහාය ඇතිව පැවැත්වුණු ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීමේ පාඨමාලාවට දෙමළ මාධ්‍ය පාසල් ඇති දිස්ත්‍රික්ක වලින් හැර හෝමාගම, රත්නපුර, ගම්පහ, ගාල්ල, මාතර, අනුරාධපුර, පොළොන්නරුව ආදී දිවයිනේ සෑම අධ්‍යාපන දිස්ත්‍රික්කයකින්ම පාහේ කැඳවනු ලැබූ ගුරුවර ගුරුවරියන් 140 දෙනෙකු පමණ සහභාගි වූහ. පාසල් පුස්තකාල ක්‍රමවත්ව පවත්වාගෙන යාමට තෝරාගත් ගුරු භවතුන්ට අවශ්‍ය කරන මූලික දැනීම ලබා දීම මෙහි පරමාර්ථ විය. එක් කාණ්ඩායමකට 70 දෙනෙක් පමණ සිටින සේ කාණ්ඩායම් දෙකකින් යුක්තව දේශන පැවැත්වුණි.

පාඨමාලාවේ ආරම්භක දිනයේ දී උත්සව සභාවේ මූලසුන හෙබවූ අධ්‍යාපන සේවා ඇමති ගරු ලයනල් ජයතිලක මැතිතුමා අනාගත පරපුරේ යහපත උදෙසා පාසැල් පුස්තකාල ක්‍රමවත්ව සංවිධානය කිරීමට මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වන බවත් පුස්තකාල සේවාවේ නියැලී සිටින ගුරු භවතුන්ට තමා කැමති කාලයක් එම පාසලෙහිම සේවය කිරීමට හැකිවන පරිදි අවස්ථාව ලබාදීමට කටයුතු කරන බවත් සඳහන් කළේය.

ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති එම්. ජේ. පෙරේරා මැතිතුමා විශේෂ දේශනයක් කරමින් කියවීමේ රුචිය ඇතිවන පරිදි පුස්තකාල වල පොත් එකතුව ගොඩනගා ගැනීම හා පුස්තකාලය ක්‍රමවත්ව පවත්වාගෙන යාමත්, පාඨකයින්ට හොඳ සේවාවක් ලබාදීමත් සඳහා පුස්තකාලයාධිපති උනන්දු විය යුතු බව පෙන්වා දෙන ලදී.

පාසල් පුස්තකාල සංවර්ධන නිලධාරි ඩී. ඩී. විජේගුණසිංහ මහතා ප්‍රථම දේශනය පවත්වමින් පාසැල් පුස්තකාල සේවයේ පරමාර්ථ පිළිබඳව විස්තරයක් ඉදිරිපත් කළේය.

පාසැල් පුස්තකාල සේවයේ පරමාර්ථ, තාක්ෂණික සේවා, වර්ගීකරණයේ න්‍යාය හා ප්‍රායෝගික සූචිකරණය න්‍යාය හා ප්‍රායෝගික, ආශ්‍රිත ග්‍රන්ථ හා සේවා, පුවත් පත් සහ වාර සඟරා, පුස්තකාල සේවා මණ්ඩලයේ සේවාවන්, සමීක්ෂණ හා තොග ගණන්

6 වෙනි පිටුවට -

## සාහිත්‍ය උත්සව ප්‍රදර්ශණයට මණ්ඩලයත්

මෙම වසරේ රාජ්‍ය සාහිත්‍ය උත්සවය දෙම්පේ කැරගල පද්මාවතී පිරිවෙන් භූමියේ නොවැම්බර් මස 28-29 යන දෙදින තුළ පැවැත් වුන අතර මේ නිමිත්තෙන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, ද ප්‍රදර්ශණයක් පවත්වමින් වාර්ෂික සාහිත්‍ය උළෙලට සහභාගි විය. මෙම ප්‍රදර්ශණය මණ්ඩලයේ කාර්ය හා පුස්තකාල සේවා විදහා දක්වන ඡයාරූප හා පෝස්ටර් ප්‍රදර්ශණයකින් සමන්විත විය.

## තොරතුරු සංග්‍රහයක්

පුස්තකාල සේවා මණ්ඩලය විසින් ප්‍රකාශයට පත් කරන ලද මහජන පුස්තකාලයාධිපතින්ගේ තොරතුරු සංග්‍රහය ආකාරයෙන් කාර්මික විද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ තොරතුරු සංග්‍රහයක්ද පළ කිරීම උදෙසා දැන් කටයුතු අරඹා ඇත.

නොබෝද්ද පුස්තකාල සේවා මණ්ඩලයේ සහාය ඇතිව කාර්මික විද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයක් හා පාඨ මාලාවක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් පවත්වන්නට යෙදුණ අතර, එයින් පසුව කාර්මික විද්‍යාල පුස්තකාලයාධිපතීන්ගේ තොරතුරු සපයා ගැනීම සඳහා ඉවහල් වන ප්‍රශ්නාවලියක් ඔවුන් වෙත යවා ඇත. ඊට පිළිතුරු සැහෙන සංඛ්‍යාවක්ද දැනට ලැබී තිබේ.

## දිස්ත්‍රික් පුස්තකාල ග්‍රන්ථයක්

පසුගියද ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් ආසියා පදනමේ අනුග්‍රහයද ඇතිව පවත්වන්නට යෙදුණ දිස්ත්‍රික් පුස්තකාලයාධිපතීන්ගේ සම්මන්ත්‍රණයේදී පැවති දේශණ හා ඒ පිළිබඳ සාකච්ඡා වාරවල පැවති සාකච්ඡාද ඇසුරෙන් සකස්වූ ග්‍රන්ථයක් පළ කිරීම උදෙසා දැන් මූලික කටයුතු සම්පාදනය වෙමින් පවතී. දැනට මෙහි අත්පිටපතෙහි සංස්කරණ කටයුතු අරඹා ඇති අතර, වසර අවසානවීමට පෙරාතුව මෙය මුද්‍රණය කරවීමේ කටයුතු ආරම්භ කිරීමට මණ්ඩලය අපේක්ෂා කරන බැව් ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ එන්. අමරසිංහ මහතා මේ පිළිබඳ ප්‍රකාශයක් කරමින් පැවසීය.



○ බ්‍රිතාන්‍ය රාජකීයයන් පිළිබඳ ශ්‍රී ලංකා එකතුව

නොබෝද දිවයිනට පැමිණි බ්‍රිතාන්‍යයේ දෙවන එලිසබත් මහ රැජින, ශ්‍රී ලංකා ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන උතුමාණන්, සමග ශ්‍රී ලංකා වාසීන් බැහැදුටු අවස්ථාවක් ඉහතින් දැක්වෙන්නේ.

බ්‍රිතාන්‍ය රාජකීයන් පිළිබඳ ශ්‍රී ලංකාවේ පළවූ විවිධ ප්‍රකාශන, සඟරා හා වෙනත් පත්‍රිකා ආදිය පිළිබඳ විශේෂ එකතුවක් දැන් ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයෙහි අරඹා ඇති අතර, පරිත්‍යාගශීලීන්ගේ ආධාරය පුස්තකාල සේවා මණ්ඩලය මෙම කාර්යය සාර්ථක කර ගනු සඳහා අපේක්ෂා කරයි.

## පුස්තකාල ප්‍රවෘත්ති

1981 හතර වන කාර්තුවේ පටන් පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනය නව නිමාවකින් යුතුව හොඳ කඩදසියේ මුද්‍රණය කිරීමට කටයුතු යොද ඇති බව සතුටින් දැනුම දෙමි.

මෙම කලාපය සහන මිලකට අලෙවි කිරීමට අපේක්ෂා කරන අතර, එහි පිටපතක මිල රු: 1.50ක් වනු ඇත. වර්ෂයකට දායක මුදල රු: 6.00ක් වනු ඇත. ඉහළ යන මුද්‍රණ හා කඩදාසි වියදම් හේතුවෙන් මෙසේ මුදලකට අලෙවි කිරීමට කණගාටුවෙන් වුවද සිදුව ඇති අතර, මේ සම්බන්ධයෙන් සියළු පුස්තකාල හා පාඨක භවතුන්ගේ සහාය මණ්ඩලය අපේක්ෂා කරයි.

මේ සමඟ ඇති පෝරමය පුරවා ඔබගේ දායක මුදල් තැපැල් හෝ මුදල් ඇනවුම් හෝ චෙක් පත් මගින් 'සභාපති, ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය' යනුවෙන් රේඛනය කොට එවන මෙන් කරුණාවෙන් දන්වමි.

මේ සම්බන්ධව වැඩිදුර තොරතුරු දැන ගැනීමට අවශ්‍ය නම් පහත ලිපිනයට හෝ දුරකථන අංක 5 98847 ට අමතා වැඩි විස්තර දැනගත හැකිය.

මේ සම්බන්ධව ලැබෙන සහයෝගය නැවතත් අගය කරමි.

මෙයට,

අධ්‍යක්ෂ/ලේකම්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත,
කොළඹ - 07.

........................මෙතනින් කපන්න........................

අධ්‍යක්ෂ / ලේකම්,
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
නිදහස් මාවත, කොළඹ - 07.

.................................................. පුස්තකාලය සඳහා රු.....................ක වටිනාකමින් යුතු තැපැල් ඇණවුම්/මුදල් ඇණවුම්/චෙක්පත් අංක.............................. එවා ඇත.
කරුණාකර . . . . . . . . . . . . . . . .
දරණ ලිපිනයට නොකඩවා වර්ෂයකට/දෙවර්ෂයකට අදාල පුස්තකාල ප්‍රවෘත්ති ප්‍රකාශනයේ පිටපත් ලැබීමට සලස්වන්න.

පුස්තකාලයාධිපති.

# පුස්තකාලය හා සමාජය

කේ. එල්. පණ්ඩිතරත්න

විසිනි

## පුස්තකාලය සමාජීය ආයතනයක් ලෙසः

මිනිස් සමාජය හා සංස්කෘතිය දෙස බලන කල අපට පෙනී යන්නේ සැම යුගයකම පිහිටි සමාජ රටාව තුළ (social fabric) ඈත කාලයේ සිටම පුස්තකාල පැවති බවයි. නූතන සමාජය මිනිසා කෙරෙහි ඉමහත් බලාපොරොත්තු තබා ඇති අතර, ඔහු සත්‍ය අගය කරන, දැනුම වර්ධනය කරගත්, නිදහස හා ස්වාධිනත්වය ගරු කරන, සමස්ත ලෝකයටම අයත් යහපත් පුරවැසියෙකු ලෙස සලකනු ලබයි. සමාජය විසින් මිනිසා කෙරෙහි තබා ඇති මෙම උසස් අපේක්ෂාවන් ගැන සලකන විට, සමාජීය ආයතනයක් ලෙස පුස්තකාලයේ ඇති ප්‍රබලකම අපට අවබෝධ වේ. ඒ අනුව පුස්තකාලයාධිපතිගේ ප්‍රධානතම කාර්ය විය යුත්තේ මෙම උසස් අපේක්ෂාවන් මිනිසාට ඉටු කළ හැකි වන පරිදි ඔහුට සැම විටම සහාය වීමයි. මේ සඳහා මිනිසාගේ අවශ්‍යතාවයන් ඔහුගේ ගති පැවතුම් හා හැකියාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට පුස්තකාලයාධිපතිට අවශ්‍ය වේ.

මේ අනුව පුස්තකාලයාධිපති හා සමාජය එකිනෙකට ඉතා සමීප වී වෙන් කළ නොහැකි ලෙස සම්බන්ධවී තිබේ. මිනිසාට යහපත් අනාගතයක් උදකරවීම යන්න හා යහපත් පුස්තකාල සේවාවක් සැල සීම යන්න සමාන අර්ථයක් ඇති පදයන් බවට පත්වේ. නූතන සමාජ සැලැස්ම අනුව පුස්තකාලය මිනිසාට සේවය කිරීම සඳහා මිනිසා විසින්ම පිහිටුවා ගන්නා ලද ජිවමාන ආයතනයක් (Living institution) ලෙස සැලකිය හැකි බව පිළිගෙන තිබේ. පුස්තකාලය සමස්ත ලෝකයේම ජනතාව කෙරෙහි බලපාන ආයතනයක් ලෙස සලකන විට, සමාජයීය ආයතනයක් (Social institution) වශයෙන් පුස්තකාලයේ කාර්යයන් හා ක්‍රියා කලාපය (role & function) පිළිබඳ අපට නිගමනයන් කිහිපයකට එළඹිය හැක. අකුරු නොදත්කම හා පොතපත කියවීමට හා ලිවීමට ඇති හැකියාව පිළිබඳ විග්‍රහයන්, ග්‍රන්ථ ප්‍රකාශන සංඛ්‍යාව පුස්තකාල සංඛ්‍යාව, කියවීමේ ද්‍රව්‍ය වර්ග හා ඒවායේ සුලභත්වය ගැන සලකා බලන කල, පුස්තකාලය සමාජ ආයතනයක් ලෙස ලබා ඇති දියුණුව පැහැදිලි වේ.

### පුස්තකාලය මගින් ඉටු කළ යුතු සමාජයීය කාර්යයන්.

පුස්තකාලය මගින් ඉටු කළ යුතු සමාජයීය කාර්යයන් ගැන සාකච්ඡා කරන විට අප ප්‍රධාන වශයෙන් සාධක තුනක් ගැන සැලකිලිමත් විය යුතුය. ඒවා නම්:

1. නිශ්පාදකයා හෙවත් කර්තෘන් හා ප්‍රකාශකයින්,

2. බෙදහරින්නා හෙවත් පුස්තකාලය හා

3. පාරිභෝගිකයා හෙවත් පාඨකය ය.

ඉතාමත්ම අනර්ඝ පුස්තකාලය වන්නේ ඉතාමත්ම කෙටි කාලයක් තුලදී වැඩිම පොත් සංඛ්‍යාවක් වැඩිම පාඨක පිරිසකට සපයන පුස්තකාලය ලෙස අප සලකන්නේ නම්, මෙම අනර්ඝතම පුස්තකාලයක තත්වය ලබා ගැනීම සඳහා පුස්තකාල කුමක් කළ යුතු දැයි අප විමසා බැලිය යුතුය.

පුස්තකාලය මගින් විශේෂයෙන්ම මහජන පුස්තකාලයක් මගින් සමාජය වෙත ඉටු කරලිය කාර්යයන් අතරින් අධ්‍යාපනය ලබාදීම හා විනෝදය ගෙන දීම (to educate and to entertain) ඉතාමත්ම උසස් කාර්යන් දෙකකි. මෙම කාර්යන් දෙක මුලින්ම ආරම්භ වී තව දුරටත් වැඩෙන ලද්දේ සමාජයීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහාය.

විනෝදය: පොත් පත් හා වෙනත් කියවීමේ ද්‍රව්‍ය මගින් පුස්තකාල සිය පාඨකයන් වෙත විනෝදය ගෙන දේ. ජනතාව වෙත විනෝදය ගෙන දෙන මාර්ග කිහිපයක් ඇතත්, පුස්තකාල මගින් විනෝදය ගෙනදීමේ ඇති හැකියාව අන් සැමටම වඩා ප්‍රබල හා ක්‍රමවත් වේ. ගර්ඩිනර් මෙය පැහැදිලි කරමින් මෙසේ දක්වා ඇත. 'රූපවාහිනිය සුලු මුදලකට දිවා රෑ දෙකෙහිම විනෝදය ලබා දෙන නමුත්, මහජන පුස්තකාල වලින් පොත්පත් විනෝදය සඳහා කියවීමට ලබා ගැනීම වැඩිවෙමින් පැවතීම පුදුමයට කාරණයකි'.

විවේකීව පොත පත කියවීමෙන් බොහෝවිට මිනිසා ආස්වාදයක් ලබන අතර, එයින් පාඨකයා අපේක්ෂා කරන විනෝදයද ලැබේ. සමාජයේ මෙම අවශ්‍යතාවය සපුරාලීම පුස්තකාලයේ වැදගත් වගකීමකි. විනෝදය සඳහා පොත පත කියවීම යනුවෙන් අදහස් කෙරෙන්නේ, පාඨකයාගේ කියවීමේ රුචිය අනුව පොත පත තෝරාගෙන කියවීම නිසා, මෙයින් ප්‍රබන්ධ පොත් කියවීම පමණක් අදහස් නොකෙරේ. එම නිසා පාලකයන්, ව්‍යාපාරිකයන්, විද්‍යාඥයන්, වෛද්‍ය වරුන් ආදීන් ඔවුන්ගේ විවේක කාලයේදී සැම විටම ඔවුන්ගේ විනෝදය සඳහා ප්‍රබන්ධ කෘතීන් පමණක් බහුලව කියවන්නේ යැයි නිගමනය නොකළ යුතුය.

මේ අනුව සමාජයීය ආයතනයක් වන මහජන පුස්තකාලය, සමාජයීය රාමුවක් තුල ක්‍රියාකරන නිසා, එහි වාසය කරන තනි පුද්ගලයන්ගේ හා කණ්ඩායම්වල අවශ්‍යතායවන් සපුරාලීමේදී මේ සැම කාරණයක්ම සැලකීමට භාජනය කරන්නේ නම්, ඉතා අනර්ඝ පුස්තකාල සේවයක් සමාජයට ඉටු කිරීමට හැකි වනු නොඅනුමානය.

අධ්‍යාපනය; පුස්තකාලය මගින් අධ්‍යාපනය ලබාදීමේ ලා ක්‍රියාකාරී වීම ගැන සාකච්ඡා කරන විට, අධ්‍යාපන ආයතන වැනි වෙනත් සමාජයීය ආයතන අතර පුස්තකාලයට හිමිවන ස්ථානය ගැන විමසිය යුතුය. මෙය කළ හැකි වන්නේ පාසැල් විශ්ව විද්‍යාල හා වෙනත් අධ්‍යාපන ආයතන (academic institutions) මේ දක්වා අධ්‍යාපන කටයුතු වලදී ලබා ඇති අඛණ්ඩ හා විශාලතම ප්‍රගතිය දෙස සිත් යොමු කිරීමෙනි. මෙම අධ්‍යාපන කටයුතු සාර්ථකවත් කිරීමේලා බොහෝ සෙයින් ආධාරවන ආයතනයක් ලෙය පුස්තකාලය සලකනු ලැබුවත්, අධ්‍යාපන කටයුතු සඳහා අත්‍යාවශ්‍ය වන ආයතනයක් ලෙස පුස්තකාලය නොසැලකීම කණගාටුවට කරුණකි. මිනිසාගේ බුද්ධිය වර්ධනය ළඟාකරලීම සඳහා සැලසුම් කිරීමේදී, පුස්තකාලය එම සැලසුම් වලට ඇතුලත් නොකිරීම බලවත් අඩුපාඩුවක් ලෙස සැලකිය යුතුය. මේ නිසා, පුස්තකාල අධ්‍යාපන ආයතන ලෙස අප එක අතකින් සලකන අතර, පුස්තකාල අධ්‍යාපන කටයුතු සාර්ථකවත් කරලීම සඳහා අවශ්‍යතම බව පිළිගෙන නොමැත. මෙම හේතුව නිසා සමාජය තුල පුස්තකාලයෙහි ඇති වැදගත්කම හා එහි කර්යයන් ගැන සැලකිලිමත් වී නොමැති අතර, ඒ ගැන එතරම් විශ්වාසයක්ද තබා නොමැත.

එසේ වුවත් ජනතාවගේ ජිවිත සාරවත් කිරීම සඳහා පුස්තකාල මගින් පොත් පත් හා වෙනත් ලිඛිත ද්‍රව්‍ය සැපයීමෙන් සලසනු ලබන සේවය අතිමහත්ය. මේ අනුව සමාජය තුල පුස්තකාලයට ලැබෙන ස්ථානය ගැන හා සමාජය කෙරෙහි පුස්තකාලය දරන වගකීම ගැන සමාජය විසින්ම එතරම් දුරට සැලකිලිමත් වී නොමැති වුවත්, පුස්තකාල මගින් අධ්‍යාපන කටයුතු ගැන දරණ වගකීම හා උනන්දුව කෙතරම් දැයි සැම මට්ටකම පාඨකයන් සඳහා සුදුසු පොත් පත් ඉතා කල්පනාකාරිව හා සැලකිලිමත්ව සැපයීමෙන් මනාව ඔප්පුවේ. එසේ නම් වෙනත් අධ්‍යාපනික ආයතන වලට හා සමාන තාරාතිරමක් හෝ තත්වයක් පුස්තකාල වලටද නොලැබෙන්නේ කුමක් නිසාද යන්න ප්‍රශ්නයකි. සමාජය තුල පිහිටා ඇති පුස්තකාල හා අධ්‍යාපනික ආයතන එකිනෙකට ආඹාර විය යුතු අතර, ඉගැන්වීමෙන් පමණක් පුද්ගලයන් තුල දැනුම වර්ධනය කර ගැනීම සඳහා චිරස්ථායි (නොනැසී පවතින) උනන්දුවක් නොපවතින බව අප පිළිගත යුතුය පුස්තකාල භාවිතයට හුරු පුරුදු නොවූ සාමාන්‍ය පුද්ගලයකු, සිය පාසැල, අධ්‍යාපනික ආයතනය හෝ විශ්ව විද්‍යාලය හැරයාමත් සමගම එම ආයතන සමග ඇති සම්බන්ධය බොහෝ විට අත් හරින නමුදු, ඔහුගේ ජිවිතයේ සැම අවස්ථාවකදීම ඔහු පුස්තකාල භාවිතයට නැඹුරු වී සිටියේ නම් පුස්තකාලය සමාජය තුල ඇති පිළිගත් ආයතනයක් ලෙස ඔහු සලකනවාට කිසිදු සැකයක් නැත.

එපමණක්ද නොව ඔහු සිය අධ්‍යාපනික කටයුතු අවසාන කිරීමෙන් පසු වුවද තවදුරටත් පුස්තකාල භාවිතා කිරීමට පෙළඹේ. පුස්තකාල භාවිතයට හුරුපුරුදු වූ පුද්ගලයා සිය ජිවිතයේ යම්කිසි අවස්ථාවකදී පමණක් නොව ඔහුගේ මුලු ජිවිත කාලය තුලදීම තමාගේ බුද්ධි වර්ධනය වැඩි දියුණු කරගත හැකි ආයතනයක් ලෙස පුස්තකාලයේ අගය වටහා ගනී. එබැවින් සමාජය තුල පුස්තකාලය දරණ ස්ථානය ගැන සලකා බැලීමේදී, පුස්තකාල මගින් දරණ මෙම ක්‍රියාකාරිත්වය ගැන සැලකිලිමත් විය යුතුය. අධ්‍යාපන කටයුතු නගා සිටුවීම සඳහා පුස්තකාල අත්‍යාවශ්‍යවූද, නිර්මාණාත්මකවූද, ක්‍රියාකාරීවූද බලවේගයක් ලෙසත් එය සමාජයේ වැඩිදියුණුවට අත්‍යාවශ්‍ය වන ආයතනයක් ලෙසත් මේ අනුව පිළිගත යුතුය.

# පාසල් පුස්තකාලයාධිපතීන්ට උපදෙස් - 5

## පාසල් පුස්තකාලය

පාසලක පුස්තකාලයක් පිහිටුවන්නේ අරමුණු දෙකක් මුල් කරගෙනය. එයින් පළමුවැන්න නම් එදිනෙද පාසලේ කෙරෙන අධ්‍යාපන කටයුතු වලට ආධාරකයක් වීමයි. පුස්තකාලයේ ඇති සටහන් උපයෝගී කර ගැනීමෙන් පාඩම් පැවැත්වීම සඳහාද, අභ්‍යාස සඳහාද ගුරු–ශිෂ්‍ය දෙපක්ෂයටම එය මහෝපකාරී වේ.

දෙවැන්න නම් විවිධ වූ ශාස්ත්‍රීය හා වෙනත් තොරතුරුද ඉගෙන ගැනීමටත්, කියවීමෙන් විනෝදයක් ලැබීම සඳහා කියවීම ඇබ්බැහි කරවීමටත්ය.

පුස්තකාලයක් පිහිට වූ පමණින් මෙම අරමුණ ඉබේ ඉටු නොවේ. එක් එක් ශිෂ්‍යයාට පුද්ගලික වශයෙන් එම අරමුණු ඉටු කර ගැනීමට ගුරුවරුන්ගේ හා පුස්තකාලයාධිපතිවරුන්ගේ උපකාරය අවශ්‍ය වේ.

ශිෂ්‍යයින්ගේ අධ්‍යාපනයට පුස්තකාලය ප්‍රයෝජනවත් අවයවයක් වීමට නම් කියවීමට ප්‍රිය උපදවන හොඳ පොත් නිරන්තරයෙන්ම පුස්තකාලයේ තිබිය යුතුය. අළුත් - අළුත් පොත් කලින් කලට පුස්තකාලයට එකතුවන බව පෙනෙන ශිෂ්‍යයින්ට ඒවා කියවීමට - බැලීමට කුතුහලයක්, ආශාවක් ඇති වේ. පොත් එකතුව මනාව සංවිධානය වී තිබීම ඔවුන්ට කැමති පොතක් තෝරා ගැනීමට පහසු වේ. එසේම ශිෂ්‍යයාට මනාප ඕනෑම වෙලාවක පුස්තකාලයට යෑමට පොත්-පත් ලබා ගැනීමට, එය විවෘතව තිබිය යුතුයි. මෙම පහසුකම් ඇති කිරීම පුස්තකාලයාධිපතීන්ගේ යුතුකම හා වගකීමද වන්නේය.

නමුත් පාසැල් පුස්තකාලය හුදෙක් පුස්තකාලයාධිපතීන්ගේ උනන්දුව පමණකින් ප්‍රයෝජනවත් තැනක් කිරීම අපහසුය.

අගනා පුස්තකාලයක් ගොඩ නැගීමේ කාර්යය මුළු ගුරු මණ්ඩලයේම සාමූහික ව්‍යායාමයකි. යම්කිසි විෂයක් ගැන ගුරුවරයාට කියා දිය හැකි කරුණුවල ප්‍රමාණය සැම විටම සීමාසහිත බව ගුරුවරු කල්පනා කරන්නේ නම්, අමතර කරුණු පොත පතින්, ප්‍රවෘත්ති පත්‍ර, චිත්‍ර, සිතියම් ආදී නොයෙක් ක්‍රම වලින් ශිෂ්‍යයන්ට සොයා ගැනීමට හැකි බව මෙනෙහි කර ඊට පහසුකම් පාසලේදී සැපයීමට සැම ගුරුවරයෙක්ම උදව් වන්නේ නම් පුස්තකාලය නිරායාසයෙන්ම වැදගත් අධ්‍යාපනික උදව් මධ්‍යස්ථානයක් වන්නේය.

ගුරුවරයා කියවන ප්‍රවෘත්ති පත්‍රයේ ශිෂ්‍යයන්ට ප්‍රයෝජන තොරතුරක්, ලිපියක්, ප්‍රවෘත්තියක් දුටු විට, එය පුස්තකාලයේ තැන්පත් කිරීමට හෝ පුස්තකාලයාධිපතිට උපදෙස් දීම, තමා කියවා අවසාන වූ සඟරාවක් පුස්තකාලයට භාර දීම යනාදී නොයෙක් අයුරින් පුස්තකාලයේ සම්පත් වර්ධනය කිරීමට ගුරුවරුනට හැකියාව ඇත. පාසලේ ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා ගැන හරි අවබෝධයක් ඇත්තේ ගුරු මණ්ඩලයට හෙයින් පුස්තකාලය ගොඩ නැගීම ගුරු මණ්ඩලයේ සාමූහික ප්‍රයත්නයක් වීම අතිශයින් අවශ්‍යයි.

පුස්තකාලයාධිපති විසින්ද නිරන්තරයෙන් පාසලේ අධ්‍යාපන පරිපාටිය විෂය නිර්දේශ යනාදිය ගැන අවබෝධයකින් යුතුව ඒ පාඩම්වලට අමුතුවෙන් ලබා දිය හැකි පොත්පත් තොරතුරු ගැන ක්‍රම සම්පාදනය ගැන සැලකිල්ල යොමු කොට ඒවා ක්‍රමයෙන් රැස් කර ගැනීමට උත්සාහ කිරීමද අවශ්‍ය වන්නේය.

විශේෂ ලියුම්කරුවකු විසිනි.

ලබන කලාපයේ: තොරතුරු මාධ්‍යයක්

## ● ජාතික පුස්තකාලයක මූලික වගකීමක්!

# ජාතික ග්‍රන්ථ නාමාවලිය

**සෑම රටක් හා ජාතියක්ම ඊට හිමි පෞරුෂය හිමිකර ගන්නේ එම රටට හෝ ජාතියට ආවේනික වූ සංස්කෘතිය හා ජීවන රටාව තුලිනි. මෙම ජීවන රටාව පදනම් වී ඇත්තේ ජාතියේ සිතුම් පැතුම් මතය. ලේඛනාරූඪ වූ හෝ වෙනත් අයුරකින් වාර්තාගත වූ ජාතියේ සිතුම් පැතුම් ජාතික සාහිත්‍යය නමින් හඳුන්වමු. මෙම ජාතික සාහිත්‍යය පිළිබඳ වාර්තාව අපි හඳුන්වන්නේ "ජාතික ග්‍රන්ථ නාමාවලිය" නමිනි.**

මේ අනුව බලන විට යම් රටක හෝ ජාතියක ජනතාව පිළිබඳව හා ඔවුන්ගේ ජීවන රටාව පිළිබඳව අවබෝධයක් ලබාගැනීමේ එකම මාර්ගය එම ජාතියේ සාහිත්‍යය පරීක්ෂා කර බැලීමය. අන්‍යෝන්‍ය අවබෝධය, සහජීවනය හා විවිධ මට්ටම්වල සහයෝගිතාවය මානව හා තාක්ෂණික සම්බන්ධතා වැනි සමස්ත මිනිස් වර්ගයාගේ සාමූහික පැවැත්මට මූලික වශයෙන් අවශ්‍යවන මෙම දැනුම ලබා ගැනීමට මග පෙන්වන මූලාශ්‍රය වන්නේ ජාතික ග්‍රන්ථ නාමාවලියයි.

ජාතික සාහිත්‍යය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට ජාතික ග්‍රන්ථ නාමාවලිය ඉතා වැදගත් මූලාශ්‍රයක් වන්නේ මේ නිසාය. අඛන්ඩව පවත්වා ගතහොත් ජාතික ග්‍රන්ථ නාමාවලිය ජාතික සාහිත්‍යයේ අඛන්ඩ වාර්තාවක් වෙයි. මෙහි සාහිත්‍යය යනුවෙන් හඳුන්වන්නේ අප සම්ප්‍රදායික වශයෙන් සාහිත්‍යයයි හඳුන්වන නිර්මාණ සාහිත්‍යය පමණක් නොව, ලිඛිත මුද්‍රිත හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් පළ කරන ලද සෑම ප්‍රකාශනයක්මය.

ජාතික ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය රටක තොරතුරු සේවාවෙහි ප්‍රමුඛත්වය ගන්නා මූලික කාර්යයකි. එහෙයින් අන්තර් ජාතික වශයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ ප්‍රමුඛ මාධ්‍යයක් වශයෙන්ද ජාතික ග්‍රන්ථ නාමාවලියට හිමිවන්නේ වැදගත් ස්ථානයකි.

ලෝකයේ සියළුම රටවල පළවන ජාතික ග්‍රන්ථ නාමාවලී එක්කොට එකට එකතු කරනු ලැබුවහොත් එය විශ්ව ග්‍රන්ථ නාමාවලියක් බවට පත්වේ. සමස්ත ලෝක ජනතාවගේ සිතුම් පැතුම් ඇතුලත් සාහිත්‍ය පිළිබඳ මහා වාර්තාවක් බවට එය පත්වනු ඇත. ජාතික ග්‍රන්ථ නාමාවලියක වැදගත්කම හා එහි ප්‍රයෝජන පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට මෙම පරිකල්පනය ප්‍රයෝජනවත්වනු ඇත. එපමණක් නොව නුදුරු අනාගතයේදී මෙම පරිකල්පනය යථාර්ථයක් බවට පත්වීම පිළිබඳව කිසිදු සැකයක්ද තබා ගත යුතු නොවේ.

ජාතික ග්‍රන්ථ නාමාවලියකින් රටක සාහිත්‍යය වාර්තාගත වන්නේ කෙසේද? එසේම මෙම වාර්තාව කොතෙක් දුරට සම්පූර්ණද යන්න ජාතික ග්‍රන්ථ නාමාවලියක ප්‍රයෝජනවත් බව සැලකීමේදී අපගේ මනසට නිතැතින්ම නගින ප්‍රශ්න දෙකකි. සෑම රටකම පාහේ ජාතික ග්‍රන්ථ නාමාවලිය රජයේ ප්‍රකාශණයකි. එහෙයින් රජයේ ප්‍රකාශණයක් සතු අනිවාර්ය ගුණාංග වන අපක්ෂපාතිත්වය හා සාධිකාරිත්වය ජාතික ග්‍රන්ථ නමාවලියක මූලික ගුණයක් වෙයි.

## පරමාර්ථ

ජාතික ග්‍රන්ථ නමාවලියක ඇතුලත් කිරීම සඳහා ජාතියේ සාහිත්‍යය පිළිබඳව තොරතුරු සපයා ගන්නේ රජය විසින් අත්කරගනු ලබන ප්‍රකාශන මගිනි. රටක නිකුත්වන සියළුම මාධ්‍යයේ ප්‍රකාශන වලින් පිටපත් යම්කිසි ගණනක් රජය වෙත භාරදිය යුතු වන සේ සෑම රජයක් විසින්ම විධිවිධාන සලසා ඇත. මෙම විධිවිධානයන්ගේ පරමාර්ථ කිහිපයකි.

සෑම ප්‍රකාශණයක්ම මුද්‍රණයෙන් හෝ වෙනත් මාධ්‍යයකින් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිකුත් කළ විට එය වෙළඳ භාණ්ඩයක් බවට පත් වෙයි. රටට ජාතියට හෝ රජයට අහිතකර වෙළඳ භාණ්ඩ මහජනයා අතට පත් වීම වැළැක්වීම රජයේ කාර්ය්‍යයකි. එපමණක් නොව පොතක බුද්ධිමය අන්තර්ගතය හැමවිටම පෞද්ගලික දේපලකි. එහෙයින් කතුවරයාගේ එම අයිතිය සුරකීමද රජය සතු යුතුකමක් වෙයි. ජාතියක සාහිත්‍යය ජාතියේ සම්පතක්ද වෙයි. මෙම සම්පත ආරක්ෂා කර ගැනීමද ඉන් ප්‍රයෝජන ගැනීමට විධිවිධාන සැලසීමද රජයේ වගකීමකි. රටක ප්‍රකාශයට පත්වන විවිධ දැනුම් ද්‍රව්‍යන්ගෙන් පිටපත් කිහිපයක් රජයේ නියමිත දෙපාර්තමේන්තුවකට හෝ ආයතනයකට භාරදිය යුතු බවට ව්‍යවස්ථා පනවා ඇත්තේ රජයේ මෙම පරමාර්ථයන් ක්‍රියාත්මක කිරීම සඳහාය.

ජාතික ග්‍රන්ථ නාමාවලිය සැකසීම සඳහා තොරතුරු සපයා ගන්නේ මූලික වශයෙන් ඉහත සඳහන් කරන ලද පරිදි ප්‍රකාශකයින් හෝ කතුවරයා විසින් රජය වෙත සපයනු ලබන ප්‍රකාශනයන්ගෙනි. මේ නිසා තර්කානුකූලව බලන විට රටේ නිකුත්වන විවිධ ස්වරූපයේ හැම ප්‍රකාශනයක්ම රජය වෙත ලැබේ. එසේම ඒවා ජාතික ග්‍රන්ථ නාමාවලියේද ඇතුලත් වෙයි.

එහෙත් මේ තත්ත්වය මෙසේම ක්‍රියාත්මක නොවේ. මෙයට හේතු කිහිපයක් වෙයි.

1. රාජ්‍යවල ජාතික ග්‍රන්ථ නාමාවලි ප්‍රතිපත්තිවල විවිධත්වය
2. රජයේ ව්‍යවස්ථා යථා පරිදි ක්‍රියාත්මක නොවීම

යන කරුණු දෙකට මෙම හේතූන් අතර මුල් තැනක් හිමිවේ.

ලෝකයේ විවිධ රටවල ජාතික ග්‍රන්ථ නාමාවලී සම්පාදන ආයතන සිය නාමාවලීන් සඳහා විවිධ ප්‍රතිපත්ති සකස්කොටගෙන ඇත. රටක පළවන විවිධ ප්‍රකාශන වර්ග වලින් සමහර වර්ග ඇතැම් ග්‍රන්ථ නාමාවලීවලට ඇතුලත් නොවේ. සිතියම්, චිත්‍ර, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ආදිය මෙසේ බැහැර කොට ඇති ප්‍රකාශන වර්ග සමහරකි. නිදසුනක් ලෙස ගත හොත් ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුලත් වන්නේ මුද්‍රිත පොත්පත් හා වාරසඟරා පමණකි. රජයේ ප්‍රකාශන සංගීත පත්‍රිකා ආදිය බ්‍රිතාන්‍ය ජාතික ග්‍රන්ථ නාමාවලියට ඇතුලත් නොවේ. මේ තත්ත්වය මත රටක පළවන සියළුම ප්‍රකාශන පිළිබඳ තොරතුරු ජාතික ග්‍රන්ථ නාමාවලී තුලට වැද නොගන්නා අවස්ථා ඇත.

## වැදගත්කම

රජය විසින් පනවා ඇති ව්‍යවස්ථා හරිහැටි ක්‍රියාත්මක නොවීමද ජාතික ග්‍රන්ථ නාමාවලියක පූර්ණත්වයට බාධා පමුණුවන සාධකයකි. විශේෂයෙන්ම දියුණුවන රටවල් විසින් පනවා ඇති මෙම ව්‍යවස්ථා තවමත් සම්පූර්ණයෙන් ක්ෂේත්‍රය ආවරණය වන සේ පනවන ලද ඒවා නොවේ. නිදසුනක් වශයෙන් ලංකාවේ තවමත් ශ්‍රව්‍ය, දෘෂ්‍ය මාධ්‍ය සම්බන්ධයෙන් මෙවැනි ව්‍යවස්ථා පනවා නැත. ව්‍යවස්ථා හරිහැටි ක්‍රියාත්මක නොවීමද තවත් ප්‍රශ්ණයකි. යම් ප්‍රකාශනයකින් නියමිත ප්‍රකාශන සංඛ්‍යාවක් රජය වෙත භාර දීමට ව්‍යවස්ථානුකූලව ප්‍රකාශකයා බැඳී සිටින නමුදු ඇතැම් ප්‍රකාශකයෝ එම ව්‍යවස්ථා කඩ කිරීමට නොපැකිලෙති. මෙවැනි තත්වයන් වළකා ගත හැක්කේ එක්කෝ දැඩි ව්‍යවස්ථා හා දඬුවම් මගින් ප්‍රකාශකයින් බැඳ තැබීමෙනි. නැතහොත් මෙම කාර්යයේ ඇති වැදගත්කම පිළිබඳව අවබෝධයක් දී ප්‍රකාශකයින් පෙළඹවීමෙනි. මෙම ක්‍රමයන් දෙකම තවම ශ්‍රී ලංකාවේ හරිහැටි ක්‍රියාත්මක නොවේ.

ජාතික ග්‍රන්ථ නාමාවලියක කාර්ය භාරය පිළිබඳව ජනතාව තුල අවබෝධයක් ඇති කිරීම ඉතා අවශ්‍ය දෙයකි. මෙම කාර්යය තල දෙකක ක්‍රියාත්මක විය යුතුය. ප්‍රථම තලය වන්නේ තොරතුරු හා දැනුම සැපයීමේ කාර්යයෙහි නියැලී සිටිනවුන්ට මේ පිළිබඳව මනා අවබෝධයක් ලබා දීමය. අධ්‍යාපනඥයින්, ගුරුවරුන්, පර්යේෂකයන්, පුස්තකාලයාධිපතීන් හා පරිපාලන නිලධාරීන් මෙම තලයට අයත් වෙයි. දෙවන තලයට අයත් වන්නේ ශිෂ්‍යයින්, පාඨකයින් ඇතුළු දැනුම් ද්‍රව්‍යයන්ගෙන් ප්‍රයෝජන ගන්නා ජනතාවයි.

## ව්‍යුහය

ජාතික ග්‍රන්ථ නාමාවලියක ව්‍යුහය පරීක්ෂාකර බැලීමෙන් ඉන් ලබාගත හැකි විවිධ ප්‍රයෝජන පිළිබඳව අවබෝධයක් ලබාගත හැකිය. ජාතික ග්‍රන්ථ නමාවලියක් සම්පාදනය කරනුයේ පරමාර්ථ කිහිපයක් ඇතිවය. ඉන් ප්‍රධානතම කාර්යය වන්නේ ජාතික සාහිත්‍යය හෙවත් ප්‍රකාශන එකතුව වැනවින් සංවිධානය කිරීමයි. බහුල වශයෙන් ජාතික ග්‍රන්ථ නාමාවලියක ඇතුලත් ප්‍රකාශනයන් සංවිධානය කරන්නේ විෂයය යටතේය. මේ නිසා දෙන ලද කාල සීමාවක් තුල යම් විෂයයකට අයත් ජාතික සාහිත්‍යයට කුමන කෘතීන් එක්වී ඇත්ද යන්න එකවරම දැන ගැනීමට ජාතික ග්‍රන්ථ නාමවලිය උපකාරී වෙයි. පාඨකයා අද ග්‍රන්ථයක් වෙත එළඹෙන්නේ විෂයය යටතේය. එහෙයින් මෙම ක්‍රමය පාඨකයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ජාතික ප්‍රගතිය පිළිබඳව දැන ගැනීමේ ද්විතියික මූලාශ්‍රයක් ලෙසද ජාතික ග්‍රන්ථ නාමාවලිය වැදගත්වේ. යම් විෂයයක් පිළිබඳව නිකුත්වන ප්‍රකාශනයන්ගේ සංඛ්‍යාව විරල නම් ඉන් පැහැදිලි වන්නේ රටේ ප්‍රබුද්ධයින්ගේ අවධානය එම විෂයය කෙරෙහි ප්‍රමාණවත් අයුරින් යොමුවී නොමැති බවයි.

ජාතියක සාහිත්‍ය බිහිවන්නේත් පෝෂණය වන්නේත් ජාතියේ අවශ්‍යතාවයන් මතය. ජාතියේ අවශ්‍යතාවයන් නිර්ණය කිරීමෙන් රටක් ගමන් ගන්නේ කුමන පැත්තටද, එනම් ප්‍රගතියේ ප්‍රවණතාවන් මොනවාද යන්න දැක ගත හැකිය. මෙය සැලසුම් සම්පාදනයට මෙන්ම පරිපාලනයටද ඉතා වැදගත් තොරතුරුවේ. අප අපේ අනාගත පරපුර වෙත උරුම කර දෙන ප්‍රමුඛතම දායාදය වන්නේ අපගේ දැනුමයි. අනාගත පරපුර ක්‍රියා කරන්නේ අප විසින් ඔවුන් වෙත උරුම කර දෙන ලද මෙම අගයන් හා දැනුම පදනම් කොට ගෙනය.

එහෙයින් අප සතු දැනුම ආරක්ෂාකොට බාල පරපුරට ප්‍රයෝජනවත් වනසේ සංරක්ෂණය කිරීමද අපගේ ප්‍රමුඛතම වගකීමකි. මෙම වගකීම ඉටු කිරීමට පුස්තකාල සේවාව ඇතුළු ප්‍රලේඛන තොරතුරු විඥපන සේවාව බැඳී සිටී. ජාතික පුස්තකාලයක අවශ්‍යතාවය කැපී පෙනෙන්නේ මෙහිදීය. ජාතික පුස්තකාලයක මූලික වගකීමක් වන ජාතික ග්‍රන්ථ එකතුව පිළිබඳ වාර්තාව එනම්: ජාතික ග්‍රන්ථ නාමාවලිය ජාතියේ දැනුම් සම්භාරයෙන් ප්‍රයෝජන ගැනීම සඳහා මං පෙන්වන නියාමකයෙක් වැන්න.

● ධනපාල ගුණසේකර

# NATIONAL LIBRARY ACT FOR SRI LANKA


**Abstract -**

**The CNLSB Act of 1970 has fulfilled its main objectives, it paves the way towards the establishment of the National Library of Sri Lanka and has created an awareness of the National Library. The time has now come to establish a seperate comprehensive National Library Act for Sri Lanka.**


## Introduction -

During the last decade the world has been witnessing a fair number of Naitonal Library Acts emerging from various parts of the world. Especially recently independent, developing countries have shown a great interest in having National Library Acts and at the sametime developed countries with their better established National Libraries, have been trying to redesign their existing National Library Acts to suit the present day requirements. The National Library Act, as clearly indicated by its name furnishes the necessary legal authority to the National Library to carry out its activities. Like all the other major educational/cultural institutions such as universities, museums, National Archives that have their own charters or Acts, the National Library also should have a similar legislative framework.

All the other National Libraries in the world, whether in well established developed countries or their recently established counterparts in developing countries have well defined National Library Acts in order to execute the functions of the National Library smoothly and effectively.

## The Present Situation - The CNLSB Act -

Since the UNESCO symposium on National Libraries in Europe, held in Vienna in 1958, UNESCO has organised and sponsored a number of National Library seminars and conferences in various parts of the world during the 1950s and 1960s. One of these-"Meeting of Experts on National Planning of Library Services in Asia" was held in Colombo in 1967 and the CNLSB Act was a direct result of this meeting.

The conference presented a National Library plan for Sri Lanka and the Act was based on this plan. The National Library Services Board was set up in 1970 and since then it has been undertaking the National Library work as part of its overall responsibilities in the library field. Part III section No. 14 of the Act deals with the powers of the Board.

"(a) to plan and assist in the organiszation and development of library services in genaral;

(b) to establish and maintain the Ceylon National Library;

(C) to advise and assist in the promotion and development of public library services;

(d) to advise and assist in the promotion and development of school libraries;

(e) to advise and assist in the publication of reading materials and the production of audio-visual aids;

(f) to advise and assist in the co-ordination and development of university libraries, junior university libraries, technical college libraries, teachers' college libraries, library services of local authorities, Government departmental libraries, and other special libraries;

(g) to advise and assist the Government in fixing the minimum academic and professional qualifications for persons employed in library services;

(h) to promote the development of library education and training; and

(i) to carry out such other functions as may be necessary for the general promotion of library services."

This Act is an important landmark in the history of library services in Sri Lanka. It is a turning point towards modern librarianship in the country. For the first time in history there is a single authority to deal with library activities, although it has the capacity to only advise and assist. For the first time there is a professional body to advise and assist the government in library matters. The Government recognized the importance of the National Library and requested the new authority to 'establish and maintain' it.

The main criticisms against the Act are that it does not provide the Board, with adequate powers to carry out the activities, in other words it is mainly concerned with only advising and assisting functions. On the other hand, although it is expected to 'establish and maintain' the National Library, the Act does not provide the necessary legal framework for this task. Although it seems that these criticisms are justified, we have to consider the background of the Act in order to understand it properly.

Miss E.J.Evans, who was UNESCO library adviser to Sri Lanka cordinated the activities of the 1967 UNESCO conference wrote on the library situation in the country "The main difficulties in respect of overall developments were: (a) absence of legislation, (b) insufficient funds, (c) shortage of literature in Sinhala and Tamil (the main local languages), (d) shortage of qualified librarians, (e) lack of co-ordination and co-operation between library services at all levels". With this gloomy background, and the unawareness and non-recognition of the importance of libraries and in most instances not having heard of National Libraries, the conference participants wanted to improve the existing conditions, rather than intrcduce a high powered library authority, which they felt was too ambiticus at the time. A well defined Act for the National Library was rather immature at that time.

The Ceylon National Library Services Board has proved during its short existence of nearly a decade, that the above approach was correct. During this period it has done a considerable amount of activities. The construction of the National Library building, starting collecting material for the National Library, recruiting a skeleton staff for the National Library have been fulfilled. Some services that will be a part of the National Library activities such as National Bibliography,library development services, International exchange have already commenced.

This is the ideal time to have a National Library Act. The Library building is under construction and the major part of the construction work is over and it is hopefully due to be inaugurated at the end of 1982. On the other hand the CNLSB has created an awareness of the National Library in the country and has also done substantial ground work as mentioned earlier. At the same time there has been increasing international pressure to have a single authority in a country to deal with all Library and Information matters and also effectively to handle international programmes in the field such as GIP, UBC, UAP and number of others.

## Main features of a National Library Act -

The function and responsibilities of a National Library have been discussed widely during the last few decades in various international seminars and conferences, and also considerable amount of literature has been produced on the subject. One of the leading experts on National Libraries is K.W Humphreys, the Librarian, University of Birmingham. His famous article on 'National Library functions' was published in 1966(UNESCO Bulletin for Libraries. Vol:20, No. 4, July-august 1966, pp. 158-169). The functions of a National Library that he has mentioned in this article are widely accepted. Humphreys divided tne National Library functions into three categories i.e 1. Fundemental functions 2. Desirable functions and 3. Functions of the National Library Service which are not necessary functions of the National Library.


**Mr Upali Amarasiri is the Assistamt Director of the National Library and Assistant Director of Library Education and Training. He holds a Masters Degree in Library Education from Loughborough University U. K.**


1. Fundamental functions of a National Library:-
   The outstanding and central collection of a Nation's literature.
   Legal deposit.
   Covering of foreign literature.
   Publication of the national bibliography.
   National bibliographical information centre
   Publication catalogues.
   Exhibitions.

2. Desirable functions of a National Library:-
   Inter-library lending.
   Manuscripts.
   Research on library techniques.

3. Functions of the National Library Service which are not necessary functions of the National Library:-
   International exchange service.
   Distribution of duplicates.
   Books for the blind.
   Professional training.
   Assistance in library techniques.

Though these functions are widely accepted as National Library functions, no doubt it has to be altered according to a particular local condition. Mr. Humphreys himself has pointed out that his list of priorities must be changed according to the local conditions, as for instance professional training which comes under the third category should be a top priority in the developing countries. Also a number of new responsibilities could be added to this list.

Thus the National Library bears an enormous responsibility. It has to carry out intended activities properly. In order to fulfill these obligations the National Library must have a clearly defined National Library Act which mentions all these activities. This is of utmost importance as nothing can be done without proper legal authority.

National Library Acts in Malayasia and Singapore can be taken as examples of modern National Library legislation. There are number of similarities between these two countries and Sri Lanka. Being countries that gained independ-


**by**
**UPALI AMARASIRI**


ence recently after long years of colonial rule all three countries have almost simillar social, economic and cultural problems. In Malayasia the National Library Act was passed in 1972. The important sections of the Act are as follows:-

**Section 3 Purpose and objectives:**

(a) to provide leadership and promote co-operation in library affairs in Malayasia.

(b) to assist the government in the promotion of the learning, use, and advancement of the National language.

(c) to support research and inquiry on a national scale


(d) to provide facilities for the enlightenment, enjoyment and community life of the people.

(e) to contribute to the development of cultural relations with the people of other countries.

(f) to provide or promote such other services or activities in relation to library matters as the Minister may direct

**Section 4 The functions of the Director General of the National Library are:**

(a) to advice the Minister on all matters relating to libraries and library service.



● **National Library Building under construction: This building is scheduled to be completed by the end of 1982**

**Pix by: D. Galappatty**

(b) to promote a nationwide system of free public libraries and library services in Malaysia.

(c) to promote and co-ordinate the development and use of the library resources of the nation.

(d) to develop and maintain by purchase or otherwise a national collection of library material, including a comprehensive collection of library material relating to Malaysia and its people.

e) to provide bibliographical service, including national bibliographical services and a union catalogue for library collections

(f) to provide modern facilities for the storage, retrieval and communication and information.

(g) to promote the advancement of library science and the professional training of librarians.

(h) to act as the agency for the national and international lending and exchange of library material

(i) to lend, sell or otherwise dispose of library material forming part of the library

(j) to do such other things as he may deem necessary, in order to give effect to the purposes and odjectives referred in section 3"[2].

## National Library of Singapore -

**Section 5, The functions of the National Library:**

(a) to promote and encourage the use of library material and information there from by the establishment of lending and reference libraries and mobile library services;

(b) to acquire library material generally and, in particular; to acquire a comprehensive collection of library material, both current and retrospective; relating to Singapore;

(c) to collect and receive all books required to be deposited in the National Library under the provisions of the printers and Publishers Act and to preserve such books;

(d) to make library material available for reference and for loan subject to proper safegaurds against loss or damage;

(e) to provide reference, bibliographic and interlibrary loan services to government departments and to parliament;

(f) to advise and to co-ordinate the resources and services of Government departments and to parliament;

(g) to obtain and provide central information on the resources and services of libraries in Singapore;

(h) to participate in national planning for all types of library service in Singapore, and to conduct research to determine library needs and possibilities;

(i) to compile a current national bibliography and retrospective national bibliographies;

(j) to compile and maintain a union catalogue of libraries of all kinds;

(k) to act as the organizing agency for the national and international lending of library material;

(l) to act as the organizing agency for the national and international exchange of library material; and

(m) to initiate and promote co-operation between the National Library and other libraries in the discharge of the above functions[3].

These two National Library Acts are good examples regarding the structure of modern National library legislation. They cover a wide range of activities Besides indicating the responsibilities of the institutions the activities of the Director General of the National Library is also seperately defined in the Malaysian National Library Act. Also it can be seen that special local requirements are included in this Act -namely the promotion of learning, use and advancement of the national languages as function of the national library.

## Conclusions :

As 'information' plays a vital role in every activity of the modern world, the National Library has become an important part of a country's development. It has its responsibilities not only in the library field, but also in the economic, education and cultural feilds among many others. It's obligations extends both nationally and internatinaly; on the one hand it is the centre of national development activities as well as it acts as a window on the world.

Therefore, it needs a well defined, carefully planned National Library Act in order to function properly. The CNLSB Act of 1970 and the CNLSB has paved the way to establish this National Institution. Now it is time to plan the Sri Lanka National Library Act and let it stands on its own feet. There is no doubt that the formulating the Act would not be an easy task.

Considering the immense national importance of the venture, it is advisable to have a National Dialogue on the subject. At present a number of institutions such as the Department of National Museum, the Department of National Archives are looking after some of these functions in the absence of a National Library. These institutions have been performing a creditable service in these areas during the last so many decades, and the future genarations will gratefully acknowledge their valueble contribution towards a National Library Service prior to the establishment of the Sri Lanka Natonal Library. The time has come for bringing together a number of services and resources widely scattered at present under a single authority designated 'The National Library of Sri Lanka'. Establishment of the National Library will it is hoped be a great news for these institutions as they can be relieved of these extra functions in the very near future.


**Ref.**

**1. UNESCO bulletin of Libraries, Vol. xxii, No. 3, pp. 117**

**2 & 3. National Libraries, Aslib Reader series; (ed. M.B. Line and J. Line) Vol. I, pp. 291 & 293.**

# ගුරු පුස්තකාලයාධිපතීන්...

– 1 වෙනි පිටුවෙන්

ගැනීම, පොත් බැඳීම හා ආරක්ෂා කිරීම, පුස්තකාල උපකරණ, පාඨක සේවා, පුස්තකාලයාධිපතිගේ කාර්යයන් සහ ගුණාංග යනාදී මාතෘකා යටතේ පුස්තකාල විද්‍යාව පිළිබඳ සුදුසුකම් ලැබූ මහත්ම මහත්මීන් විසින් දේශන පවත්වන ලදී.

පුස්තකාල සේවා මණ්ඩලීය නිරීක්ෂකයකුගේ නිගමන රැගත් මෙම වාර්තාව අදාල වගකිවයුතු අංශ වෙත ඉදිරිපත් කරන ලදී.

මෙදින සහභාගිවූ ගුරු පුස්තකාලයාධිපතීන් අතර සහතික නොලත්, පුහුණු, උපාධිධාරී ආදී වශයෙන් විවිධ අධ්‍යාපන මට්ටම්වල ගුරුවරුන් විය. ඒ අතරම විදුහල්පතිවරුන් කීප දෙනකුද විය. මෙම ගුරු භවතුන්ගෙන් සමහරු දැනට විදුහල්වල ක්‍රියාත්මක පුස්තකාල භාරව කටයුතු කරන්නන් වූ අතර ඇතැම් අය මෙම පුහුණුව ලබා ගැනීමෙන් පසු තම විදුහල්වල පිහිටුවන පුස්තකාලයන්හි සේවය කිරීමට බලාපොරොත්තුවන්නන් වූහ.

## අනවබෝධය

කෙසේ වුවද ඔවුන් සමග සාකච්ඡා කර බැලීමේදී වැටහී ගිය එක් කරුණක් වූයේ දැනට පුස්තකාලයාධිපතීන් ලෙස කටයුතු කළත් පුස්තකාල විද්‍යාව පිළිබඳ ක්‍රමානුකූල අවබෝධයක් තිබුණේ ඔවුන්ගෙන් කීප දෙනකුට පමණි. පුස්තකාල විද්‍යාව පිළිබඳව පළමුව ඔවුන්ගේ ආකල්පය වූයේ එය වැඩි වගකීම් වලින් තොර පොත්-පත් බෙදදීම, රැස්කර තැබීම ආදී වශයෙන් ඉතා සරල කාර්යයන් කීපයක් පමණක් බවයි. එහෙත් පාඨමාලාව අවසානයේදී ඔවුන්ගේ එම අදහස් වෙනස් වූ බව ප්‍රකාශ කෙරුණි. පෙරදී තමන් පුස්තකාලවල කළ සේවයට වඩා වැඩි ක්‍රමානුකූල සේවයක් ඉටු කිරීමට මෙම දැනුම් සම්භාරය තමන්ට ප්‍රයෝජනවත් වන බවත් ප්‍රකාශ කෙරුණි. මෙම ගුරු භවතුන් ඉතා උනන්දුවෙන් හා ඕනෑකමෙන් යුතුව පාඨමාලාවට සහභාගි වූ බව කැපී පෙනෙන ලක්ෂණයක් විය.

## බාධක

ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු ලෙස ගුරු මණ්ඩලයකින් පුද්ගලයකු තෝරා ගැනීමේදී ක්‍රමවත්ව තේරීම වැදගත් බව මෙහිලා පෙන්වා දිය යුතුවේ. මක්නිසාද යත් මෙම පාඨමාලාවට සහභාගි වූ ඇතැම් අය විදුහල්පතිවරුන්ය. විදුහලක කාර්ය බහුල පුද්ගලයකු වන මොහුට අප බලාපොරොත්තු වන පුස්තකාල සේවා ඉටු කිරීමට ඇති බාධක බොහෝය. එසේම ඇතැම් ගුරු භවතුන් විශ්‍රාම යෑමට ආසන්න අයවළුන් බව දක්නට ලැබුණි. මොවුන්ගෙන්ද පුස්තකාල සේවාවට බලාපොරොත්තු වන තරම් සේවයක් සෑහෙන කාලයක් ලබා ගැනීමට හැකි වේ යයි සිතිය නොහැක. සමහර ගුරු භවතුන් බාලදක්ෂ කටයුතු ආදී විදුහලේ වෙනත් බාහිර කටයුතුවල නිරත වූවන්ය. ඔහුට විදුහලේ ඉටු කළ යුතු අමතර කාර්යය භාරයක් ඇති හෙයින් පුස්තකාලය වෙනුවෙන් මිඩංගු කිරීමට කාලය ලැබෙන්නේ ඉතා අල්ප වශයෙනි.

මේ නිසා පාඨමාලාවට ගුරු භවතුන් තෝරා ගැනීම කල්පනාකාරිව සොයා බලා කළ යුතු බව පෙන්වා දිය හැක. විදුහල්පතිවරුනට පාසැල් පුස්තකාලයක ඇති වැදගත්කම හා එහිදී විදුහල්පත්ගෙන් ඉටු විය යුතු කාර්යයන් පිළිබඳව වෙනමම පුහුණුවක් ලබාදීම යෝග්‍ය වන නමුදු විදුහලක් පුස්තකාලයාධිපතිවරයෙකු වශයෙන් කටයුතු කිරීමට තෝරා ගැනීමෙන් මෙම සේවාස්ථ පුහුණුවේ අරමුණු ඉටුවීමට බාධාවක් වන බවද පෙන්වා දිය යුතුවේ. මේ නිසා ගුරු පුස්තකාලයාධිපතිවරයෙකු තෝරා ගැනීමේදී පුස්තකාලයක සේවය කිරීමට උනන්දුව හා ලැදියාව ඇති, පාසැලේ වෙනත් බාහිර කටයුතු වලින් බැඳීම් රහිත වූ ගුරු භවතෙකු තෝරා ගෙන පුස්තකාල පුහුණුවක් ලබාදීමෙන් පාසැලේ පුස්තකාල ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට ආධාරවන අතර මෙම පාඨමාලාවේ අරමුණු නිසි පරිදි ඉටුවීමක් බවද කිව හැකියි.

විදුහලක කාල සටහන පිළියෙල වී ඇත්තේ දිනකට කාල පරිච්ඡෙද 8 බැගින් සතියකට කාල පරිච්ඡෙද 40 ක් සම්පූර්ණ වන අයුරිනි. අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛන මගින් සතියක් තුල එක් එක් විෂයයන් ඉගැන්විය යුතු කාල පරිච්ඡෙද ගණන තීරණය කර ඇති අතර විදුහල්පතිවරුන් කාල සටහන් පිළියෙල කිරීමේදී මෙම චක්‍රලේඛන උපදෙස් පිළිපැදිය යුතු වේ. මෙම කාල පරිච්ඡෙද ගණන වෙනස් කිරීමේ හැකියාවක් විදුහල්පතිවරයාට නැත. පුස්තකාලය සඳහා කාල පරිච්ඡෙද වෙන්කර ඇත්තේ 11, 12, ශ්‍රේණි සඳහා පමණි. 6, 7,, 8, 9, 10 වැනි ශ්‍රේණි සඳහා කාල පරිච්ඡෙද වෙන් කිරීම විදුහල්පතිවරුන්ට ඉහත සඳහන් කරුණ නිසා අපහසුවී ඇත. එසේම පුස්තකාල පුහුණුව ලබා යන ගුරු භවතාද, විදුහල්පතිවරයාද ගුරු භවතාගේ කාල සටහන පිළියෙල කිරීමේදී ගැටළුවකට මුහුණ පායි.

දෙපාර්මේන්තුවෙන් නියම කරන ලද පැය ගණනක් අනිවාර්යයෙන්ම එම විෂය ඉගැන්වීමට යෙදිය යුතු නිසා පුස්තකාල පුහුණුව ලබා තිබුණත්, පුස්තකාලයක අගය වටහාගෙන ඒ සඳහා කටයුතු කිරීමට බලාපොරොත්තුවූවත් දෙපාර්තමේන්තු නියමයන්ට එකඟව කටයුතු කළයුතු හෙයින් ඔවුන්ට සිදුවන්නේ පුස්තකාලය පසෙක තිබියදී ඉගැන්වීමේ කටයුතුවල යෙදීමටය. මේ කරුණ ගුරු පුස්තකාලයාධිපතීන් අධෛයමත් කරන්නක් වී ඇත. මෙම ගැටළුව විසඳීමට නම් පුස්තකාල පුහුණුව ලබා යන ගුරු භවතුන් එම කාර්යය සඳහා යෙදවීමටත් 6,7,8,9,10 යන ශ්‍රේණිවල කාල සටහනේ පුස්තකාලය සඳහා කාල පරිච්ඡෙද වෙන් කිරීමටත් විධිවිධාන සැලැස්වෙන චක්‍රලේඛනයක් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ යුතුව ඇති අතර මේ සඳහා පුස්තකාල සේවා මණ්ඩලය මගින් උපදෙස් දිය හැක.

## යෝජනාවක්

මෙම පුහුණුවීමේ පාඨමාලාවේදී වර්ගීකරණය හා සූචිකරණය පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලබා දෙන දේශන පැවැත්වුණු අතර, එමගින් ගුරු භවතුන්ට ඒ පිළිබඳ සාමාන්‍ය දැනීමක් ලැබෙන්නට ඇතැයි සිතිය හැක. ලැබූ දැනුම පාසැල් පුස්තකාලයේදී ක්‍රියාත්මක කරන විට යම් යම් ගැටළු හා ප්‍රශ්ණ පැන නැගීමට ඉඩ ඇත. එවිට ගුරු පුස්තකාලයාධිපතිවරයා අපහසු තත්ත්වයකට මෙන්ම, ගැටළුවෙන් මිදීමට නොහැකි තත්ත්වයකට පත්වනු ඇත. මෙ තත්ත්වය මගහරවා ගැනීමට නම් සාර්ථක විය හැකි ක්‍රමයක් ඉදිරිපත් කරමු.

පුහුණුව ලබා පාසැල්වලට ගොස් පුස්තකාල කටයුතුවල නියැලීමට පාසැල් වාරයක පමණ කාලයක් ඉඩදී නැවතත් ඔවුන් කැඳවා ඔවුන් ලැබූ අත්දැකීම් හා ගැටළු ආශ්‍රයෙන් ඒවාට විසඳුම් ලබාදෙන, ප්‍රායෝගික අංශයට බරවූ වැඩ මුළුවක් පැවැත්වීම මැනවි. ප්‍රාදේශීය වශයෙන් එක් එක් මධ්‍යස්ථානවලට ගුරු පුස්තකාලයාධිපතීන් කැඳවා මෙම ප්‍රායෝගික පුහුණුව ලබා දීම වඩාත් යෝග්‍ය යයි සිතමි. තවද මෙම පාඨමාලාවේදී සංවිධානය වූ පුස්තකාලයක් නැරඹීමට ගුරු භවතුන්ට අවස්ථාවක් නොලැබුණු නිසා එම කාර්යයද ඒ අවස්ථාවේදී ඉටු කිරීම ප්‍රයෝජනවත් වන බව සඳහන් කළ යුතුය.

## ප්‍රමිති

මෙම පාඨමාලාවට සහභාගි වූ ගුරු භවතුන් සමඟ සාකච්ඡා කිරීමේදී පෙනී ගියේ ඇතැම් පාසැල්වල පුස්තකාල සඳහා වෙන්වූ ස්ථානයක් නොමැතිව සමහර විට විදුහල්පතිගේ කාර්යාලය තුළ පොත් තැන්පත්ව ඇති අල්මාරියක් හෝ දෙකකට පුස්තකාලය සීමා වී ඇති බවයි. පුස්තකාලය සඳහා නියමිත ගොඩනැගිල්ලක් නොතිබීම, නියමිත උපකරණ නොමැතිකම මෙම කාර්යය ඉටු කිරීමේදී මුහුණ පෑමට සිදුවන බාධක ලෙස දැන ගැනීමට ලැබුණි. මේ තත්ත්වය මගහරවා ගැනීමට පුස්තකාල සේවා මණ්ඩලයට යම් වැඩ කොටසක් ඉටු කළ හැකි බව පෙනේ.

දැනට මහජන පුස්තකාල සඳහා ප්‍රමිතියක් සකස්ව ඇත්තා සේ එක් එක් පාසැලේ පවතින තත්ත්වයට සරිලන සේ සකස් විය යුතු උපකරණ යනාදිය පිළිබඳවත් ප්‍රමිතියක් සැකසීම අවශ්‍යවී ඇත. මෙසේ කළහොත් දිනෙන් දින වැඩෙන සජීවී සංස්ථාවක් වන පාසැල් පුස්තකාලය අනාගතයට ඔරොත්තු දෙන ලෙස වැඩෙමින් විදුහල තුල ප්‍රධාන අවයවයක් බවට පත්වනු නොඅනුමානය.

ගුරුවරුන් සමඟ කළ සාකච්ඡාවේදී පෙනී ගිය අනෙක් කරුණ නම් පුස්තකාලයට අවශ්‍ය කරන මූලික උපකරණ එනම් මුද්‍රා, දිනමුද්‍රා සූචි පත්‍රිකා, සූචි පත්‍රිකා කැබිනට්ටු යනාදී උපකරණ ලබා ගැනීමට බොහෝ පාසැල් අපහසු තත්ත්වයක පසුවන බවයි. මේ සඳහා පුස්තකාල සේවා මණ්ඩලයෙන් එම ආධාර අවශ්‍ය කරන පුස්තකාල සොයා බලා අවශ්‍ය ආධාර දීමේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීම යෝග්‍යය.

තවද බොහෝ පුස්තකාලවල ඇති ග්‍රන්ථ සම්භාරය ඉතා දුර්වල තත්ත්වයක පවතින බව පෙනී යයි. බොහොමයක් පුස්තකාලවල ඇති ග්‍රන්ථ සංඛ්‍යාව 1500 වඩා අඩුවන අතර, සමහර පුස්තකාලවල පොත් 300, 400 කට පමණ සීමා වී ඇත. එයිනුත් විශාල සංඛ්‍යාවක් නම් කතා පොත් වේ. මේ තත්ත්වය යටතේ පාසැල් පුස්තකාලවල ග්‍රන්ථ සම්භාරය වැඩි කර ගැනීම සඳහා යම් ආධාරයක් ලබාදීම කළ යුතුව ඇත.

## සහයෝගය

පාසල් පුස්තකාල පරිපාලනය පිළිබඳව පුහුණුව ලබා පාසලට යන ගුරු භවතා මුහුණ පාන තවත් ගැටළුවකි. එම සේවාව ඉටු කිරීම සඳහා විදුහල්පති, මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ යනාදී ඉහලින් සිටින නිලධාරින්ගේ සහයෝගය නිසි පරිදි නොලැබීම. මේ අයගෙන් වැඩි පිරිසකට පාසැල් පුස්තකාලයක ඇති වැදගත්කම ගැන අවබෝධයක් නැත. මේ කරුණ නිසා මේ අය කැඳවා පාසැල් පුස්තකාලයක ඇති වැදගත්කම ගැන අවබෝධයක් ලබාදී පාසැල් පුස්තකාල දියුණු කිරීමට ඒ අයගෙන් ඉටුවිය යුතු කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාදීම කළ යුතුම කාර්යයක් වී ඇත.

පාසැලේ වැඩ කටයුතු සඳහා එකතු කෙරෙන පහසුකම් ගාස්තු මුදල් වියදම් කිරීමේදී බෝහෝ විදුහල්පතිවරු ක්‍රීඩා හා අනෙකුත් බාහිර වැඩ සඳහා මුදල් වෙන් කොට ඉතිරි වුවහොත් පමණක් පුස්තකාලයට මුදල් වෙන් කරන බවක් පෙනී යයි. පාසැල් පුස්තකාලය දියුණු කිරීමට නම් මේ තත්ත්වය වෙනස් කළ යුතුව ඇත. විදුහල්පතිවරුන් රැස්කර පුස්තකාලය පිළිබඳව අවබෝධයක් ලබාදිය යුතු අතරම පහසුකම් ගාස්තු වලින් යම් සැලකිය යුතු ප්‍රමාණයක් පුස්තකාලය සඳහා වෙන් කළ යුතු යයි අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛනයක් මගින් නියම කළහොත් මේ තත්ත්වය මගහරවා ගත හැකි වේ යයි සිතිය හැක.

## වෙනම නිලධාරියෙක්

විදුහලක ඉගැන්වෙන සිංහල, ඉංග්‍රීසි, සමාජ අධ්‍යයනය, නැටුම්, සංගීතය, වඩු වැඩ, ගෘහ විද්‍යාව, ශාරීරික අධ්‍යාපනය යනාදී සියලුම විෂයයන් පිළිබඳව ඒ ඒ විෂයයට වෙන්වූ විෂය භාර අධ්‍යාපන නිලධාරියෙකු අධ්‍යාපන ප්‍රදේශයක් භාරව සිටින නමුත් පාසැල් පුස්තකාල සේවාව පිළිබඳව එවැනි කාර්යයභාර අධ්‍යාපන නිලධාරියෙකු නොමැත. මෙවැනි නිලධාරියෙකු සිටින්නේ නම් ගුරු පුස්තකාලයාධිපතිවරයාට තම සේවාවේදී අවශ්‍ය කරන උපදෙස් ලබා ගත හැකිවේ.

7 වෙනි පිටුවට —

# ජාතික පුස්තකාලයෙන්

## මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි පුස්තකාල පොත් එකතුව

● ඩබ්ලිව්. ජී. ඩබ්ලිව්. ආරියරත්න

ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ සිංහල පිළිබඳ මහාචාර්යවරයා වශයෙන් වර්ෂ ගණනාවක් සේවය කළ සිංහල ශබ්ද කෝෂයේ හා සිංහල විශ්ව කෝෂයේ ප්‍රධාන කර්තෘ වශයෙන්ද අනුපමේය සේවයක් ඉටු කරන මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා සිංහල, පාලි, සංස්කෘත, හින්දි, මරාති, ගුජරාටි, ප්‍රාකෘත යනාදී පෙරදිග භාෂා මෙන්ම පෘතුගීසි, ඉංග්‍රීසි, ලන්දේසි යනාදී අපර දිග භාෂා පිළිබඳවද හසල දැනුමක් ඇති ප්‍රවීණ පඬිවරයෙකි.

මෙතුමා ජීවිත කාලයක් තිස්සේ ගොඩ නගා ඇති පොත් එකතුව ගැන විමර්ශනයක යෙදෙන විට පෙනී යන්නේ එය විෂය ක්ෂේත්‍රයන් රාශියක් පුරා විහිදී යන එමෙන්ම එම විෂයයන් පිළිබඳව ජාත්‍යන්තර මට්ටමින් එකතු විය යුතු දුර්ලභ හා එමෙන්ම වටිනාකමින්ද වැඩි ග්‍රන්ථ සම්භාරයකින් යුක්ත වන බවයි.

භාෂා හා සාහිත්‍ය පළිබඳ අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථියෙක් නම් සිංහල, පාලි, සංස්කෘත, මරාති, මලයාලම්, ගුජරාටි, ඇසමීස්, චීන, බෙංගාලි, බිහාරි, අරාබි, ග්‍රීක, ඉතාලි, ප්‍රංශ, ලතින්, පෘතුගීසි, ලන්දේසි, ජර්මන්, ඉංග්‍රීසි, බ්‍රසීලයන් යනාදී පෙර අපර දෙදිග භාෂා ගණනාවක් පිළිබඳව වාග් විද්‍යාත්මක පර්යේෂණ පොත්, ව්‍යාකරණ පොත්, ශබ්ද කෝෂ හා ඒ ඒ භාෂා පිළිබඳ හසල දැනුම් ඇති විද්වතුන්ගේ පර්යේෂණාත්මක රචනා වලින් හා අත්ලිපි හා සටහන් හා එම භාෂා වලින් සැකසි ඇති සම්භාවනීය සාහිත්‍ය කෘති වලින්ද යුක්තවීම නිසා පර්යේෂණාත්මක අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථියෙකුට මෙම පොත් එකතුවෙන් මාහැඟි ප්‍රයෝජන ලබා ගත හැකිවේ.

සංස්කෘත සාහිත්‍යයේ එන පැරණි සම්භාව්‍ය කෘතීන් ගණනාවක්ද මෙහි අඩංගුවීම නිසා විශේෂයෙන්ම සංස්කෘත සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථියෙකුට ඉතා ප්‍රයෝජනවත්ය.

ඉතිහාසය හා පුරා විද්‍යාව පිළිබඳ පර්යේෂකයෙකුට ඉතා ප්‍රයෝජනවත් පොත් පත් රාශියකින් මෙම එකතුව සමන්විත වන අතර විශේෂයෙන්ම ලංකා ඉතිහාසය පිළිබඳව කොඩ්රින්ටන්, බ්‍රොහියර්, එච්. සී. පී. බෙල්, මහාචාර්ය සෙනරත් පරණවිතාන යන වියතුන්ගේ පර්යේෂණාත්මක කෘති සෙල් ලිපි සංග්‍රහයන්, සීගිරි කුරුටු ගී ( Sigiri Graffiti) වැනි පර්යේෂණාත්මක වටිනාකමින් යුක්ත පොත් පත් රාශියක් අඩංගු වන අතර ලංකාවේ පෘතුගීසි ලන්දේසි පාලන සමයයන් පිළිබඳ අධ්‍යයනයකදී ඉතා ප්‍රයෝජනවත් වන පෘතුගීසි හා ලන්දේසි භාෂාවලින් සකස් වී ඇති පර්යේෂණාත්මක කෘති රාශියක් මෙම එකතුවට අඩංගු වේ.

බුදු දහම හා බෞද්ධ ශිෂ්ටාචාරයන් පිළිබඳව සිංහල, ඉංග්‍රීසි, හින්දි, පාලි, ජර්මන් යනාදී භාෂා වලින් සකස්ව ඇති පොත් පත්, වාර සඟරා යනාදියත්, එම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගේ පර්යේෂණාත්මක කෘතීන් ගෙනුත් මෙම පොත් එකතුව පෝෂිත වන නිසා එම ක්ෂේත්‍රයේ පර්යේෂණාත්මක අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථියෙකුට මෙම පොත් එකතුව නොමඳ පිටුවහලකි.

ශාස්ත්‍රපති( M. A.), ශාස්ත්‍රවේදී ( Ph.D,) වැනි පශ්චාත් උපාධි සඳහා ඉදිරිපත් කළ නිබන්ධන අත් පිටපත් රාශියක්ද, භාෂා සාහිත්‍ය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ කළ වියතුන්ගේ සටහන් හා අත් පිටපත්ද මෙම එකතුවේ තිබීම නිසා වටිනාකම බෙහෙවින් වැඩිය.

මහාචාර්ය හෙට්ටිආරච්චි මහතා විවිධ සාහිත්‍ය කෘතීන්හි ගැඹුරට පර්යේෂණ කරමින් තබා ඇති සටහන් හා විවේචන අඩංගුවීම නිසා ගැඹුරින් අධ්‍යයනයක යෙදෙන විද්‍යාර්ථියෙකුට මෙම පොත් එකතුවෙන් ඇති ප්‍රයෝජන අති මහත්ය.

● මතු සම්බන්ධයි

# මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයෙන්

## පුස්තකාල පරීක්ෂණ

පුස්තකාල සේවා මණ්ඩලයේ මහනුවර ශාඛාව විසින් මහනුවර, වත්තේගම, කොබෙයිගනේ, කෑගල්ල, අලුදෙණිය, හතරලියැද්ද, ගලගෙදර, දියතිලක, කුලියාපිටිය, ඉබ්බාගමුව, අම්පිටිය, බෝවල, ගලිගමුව, මාවනැල්ල, කඩුගන්නාව යන මහජන පුස්තකාලද, නිකවැරටිය මධ්‍ය මහා විද්‍යාලයීය පුස්තකාලය සහ කුරුණෑගල කණිෂ්ඨ කාර්මික විද්‍යාලයීය පුස්තකාලයද පරීක්ෂා කරන ලද අතර මේවායින් බොහොමයකට තාක්ෂණික උපදෙස් හා සහායයන් සපයන ලදී.

මහනුවර මධ්‍යස්ථානය මගින් ක්‍රියාත්මක කරනු ලබන පොත් හුවමාරු සේවය යටතේ මෙම කාලය තුළදී මහජන පුස්තකාල 37කටද, පාසැල් පුස්තකාල 10කට හා බන්ධනාගාර පුස්තකාල 2කටද පොත් කට්ටල සපයා ඇත.

## ව්‍යාප්ති සේවා

මහනුවර මහජන පුස්තකාලය මගින් පසුගිය පෙබරවාරි මස පවත්වන ලද අන්තර් කියවීම් ශාලා දැනුම මිනුම තරඟය සංවිධානය කිරීම සඳහා අවශ්‍ය උපදෙස්ද, තරඟ විනිශ්චය කිරීම සඳහා අවශ්‍ය සහායයන්ද සපයා ඇත.

ජූනි මස 22 දින අම්පිටිය ගම්සභා මහජන පුස්තකාලයේ ශාඛාවක් විවෘත කරන ලද අතර, මහනුවර මධ්‍යස්ථානය මගින් එම පුස්තකාලයට රුපියල් දහසක් පමණ වටිනා පොත් කට්ටලයක් ත්‍යාග වශයෙන් පරිත්‍යාග කරන ලදී.

## විවෘත කිරීම්

අලුදෙණිය ගම්සභාව මගින් නව මහජන පුස්තකාලයක් ජූනි මස 29 වන දින ආරම්භ කරන ලදී. මෙම පුස්තකාලය විවෘත කිරීමට පෙරාතුව මහනුවර මධ්‍යස්ථානය මගින් පුස්තකාලය ක්‍රමවත් ලෙස සංවිධානය කිරීම සඳහා අවශ්‍ය සියලුම තාක්ෂණික උපදෙස් හා සහාය සපයන ලද අතර රුපියල් දහසක් පමණ වටිනා පොත් කට්ටලයක් ත්‍යාග වශයෙන් පිරිනමන ලදී.

## ප්‍රකාශන

ඩිවි දශම වර්ගීකරණයේ තුන්වන සාරාංශයේ සිංහල පරිවර්තනයේ නව සංස්කරණයක් මහනුවර මධ්‍යස්ථානය මුද්‍රණය කොට ප්‍රකාශයට පත් කරන ලද අතර එය අවශ්‍ය පුස්තකාල අතර බෙදා හැරීම ආරම්භ කර ඇත.

## පුහුණු පාඨ මාලාවක්

1981.02.02 සිට 1981.02.13 දක්වා කාලය තුල පාසැල් හා මහජන පුස්තකාලයාධිපතීන් සඳහා දෙසති සේවාස්ථ පුහුණු පාඨමාලාවක් සංවිධානය කොට මහනුවර ප්‍රාදේශීය මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මේ සඳහා පාසැල් පුස්තකාලයාධිපතීන් තිදෙනෙකු හා මහජන පුස්තකාලයාධිපතීන් අටදෙනෙකු සහභාගි වූහ.

# ගුරු පුස්තකාලයාධිපතීන්...

– 6 වෙනි පිටුවෙන්

අනික් විෂයයන් භාර ගුරු භවතුන්ට තම ආචාර්ය මණ්ඩලයේ අනික් ගුරු භවතුන්ගෙන් අවශ්‍ය උපදෙස් ලබා ගැනීමට හැකියාව ඇතත් ගුරු පුස්තකාලයාධිපතිවරයා එම කාර්යයේදී අසරණ තත්ත්වයකට පත්වන නිසා පුස්තකාල විද්‍යා සුදුසුකම් ලැබූ අධ්‍යාපන නිලධාරියකු අධ්‍යාපන ප්‍රදේශයක් භාරව සිටීම අවශ්‍ය කටයුත්තක් බව පෙනේ. මේ මගින් ක්‍රමවත්ව හා සංවිධානාත්මකව පාසැල් පුස්තකාල දියුණු කිරීමට හැකිවේ යැයි විශ්වාස කරමු.

මෙම කරුණු ක්‍රියාත්මක කිරීමෙන්, දැනට විදුහල්වල නොසලකා හැර තිබෙන, නොවැදගත් අංගයක් ලෙස අමතක කරදමා ඇති පාසැල් පුස්තකාලය අනාගතයේදී විදුහල තුල ඉතා වැදගත් අත්‍යවශ්‍ය අංගයක් ලෙස පෙරමුණට ගැනීමට හැකිවනු ඇත.

**සාරාංශ**

● ගුරු භවතුන් ඉතා උනන්දුවෙන් පාඨමාලාවට සහභාගි වූ බව.

● ගුරු පුස්තකාලයාධිපතිවරයෙක් තෝරා ගැනීමේදී කරුණු කීපයක් ගැන සැලකිලිමත් විය යුතු බව.

● ගුරු පුස්තකාලයාධිපතිවරයෙක් ලෙස සේවය කිරීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛනයක් මගින් අවස්ථාව ලබා දිය යුතු බව හා 6, 7, 8, 9, 10 ශ්‍රේණි කාල සටහන්වල පුස්තකාල කාල පරිච්ඡේද අඩංගු විය යුතු බව.

● වර්ගීකරණය සූචිකරණය යනාදී අංශ පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබා දිය යුතු බව.

● පාසැල් පුස්තකාල සඳහා සුදුසු ප්‍රමිතියක් සකස් කළ යුතු බව.

● පුස්තකාලය සංවිධානයේදී අවශ්‍ය කරන මූලික උපකරණ සැපයීම.

● ග්‍රන්ථ සම්භාරය ඉතා දුර්වල පුස්තකාලවලට එය වැඩිකර ගැනීම සඳහා ආධාර දීම.

● විදුහල්පති, මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි, ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ යනාදී නිලධාරීන්ට පුස්තකාලවල ඇති වැදගත්කම පිළිබඳ අවබෝධයක් ලබාදීම.

● පාසැලේ පහසුකම් ගාස්තු වියදම් කිරීමේදී පුස්තකාලය සඳහා වෙන් කෙරෙන මුදල් ප්‍රමාණය ගැන චක්‍රලේඛනයක් මගින් විදුහල්පතිවරුනට උපදෙස් දීම.

● පාසැල් පුස්තකාල ගැන සොයා බැලීමට අධ්‍යාපන ප්‍රදේශයක් භාරව පුස්තකාල විද්‍යා සුදුසුකම් ලැබූ නිලධාරිවරයෙක් පත් කිරීම.

# පුස්තකාල ප්‍රවෘත්ති

O LIBRARY NEWS O நூலகச் செய்தி


# D.S. SENANAYAKE MEMORIAL LIBRARY TAKES LEADERSHIP

## IN THE DISTRICT LIBRARY SYSTEM

by **Mrs. D. Ratnayake**, Librarian

**At a conference of the District Library Committee convered by the Mayor of Kandy, Mr. Tilak Ratnayake, the Chairman of the National Library Services Board, Mr. M. J. Perera said that the Library Services Board is happy to note that the D. S. Senanayake Memorial Library, Kandy is in the vanguard of the District Library Project.**

Mr. Tilak Ratnayake, the Mayor, said that Kandy Municipality Library is the oldest public Library in the island; established in 1920 long before the Colombo Public Library was started, and has, over the years developed into the large library system that it is today. It is a happy event that it has now being called upon to take the leadership in developing a cordinated public library system covering the entire Kandy District.

The Chairman of the District Development council Mr. R.M.C. Ratnayake proposed that the satellite libraries of the Kandy public library forming the District system should be selected on an electoral basis so that each electorate will have one main library adequately developed to participate in the proposed scheme.

If this is acceptable, Mr. Ratnayake said that the necessary funds for development work of such libraries could be met from District council budget. A tentative list of 16 libraries were selected for this purpose subject to the approval of the Members of Parliament of the District.

The National Library Services Board has approved a grant of Rs 20,000/- for books and audio-visual materials for the District library System to be operated from the D. S. Senanayake Memorial Library, Kandy. The Asia Foundation also donated a consignement of books worth Rs 50,000.

# LIBRARY NEWS

**LIBRARY NEWS** hither to published in half demy newsprint will be issued in the usual "newsletter format" printed in high quality paper, commencing 1982. Being the only professional publication of its kind in Sri Lanka, librarians will be pleased to obtain their copies in the new format convenient for reading, filing and preservation.

Despite soaring costs of printing we wish to continus the publication to ensure maintain this communication line between the Library Services Board and the professional librarians which is vital to the very existence and sustenance of the profession. After subsidising, a nominal price of Rs. 1.50 per copy (annual subscription of Rs. 6 50 (Sri Lanka Currency) has been fixed in order to recover at least part of the expenditure on printing.

Librarians who wish to place subscription are requested to fill in the form below and post it to the Director together with a Cheque/M O /P O./ drawn in favour of The Chairman, Ceylon National Library Services Board.

Director/Secretary.

Library Services Board
Independence Avenue, Colombo 7.
Tele: 598847

.......................................Detach here.......................................

**Director / Secretary,**
**Library Services Board,**
**Independence Avenue, Colombo 7.**

I have enclosed Cheque/Money Order/Postal Order No.......................................... subscription for 198.......... for.......................................... (Name of Libraay).

Please continue to supply LIBRARY NEWS to the following address for one / two years commencing from..........................................
Address:..........................................
..........................................

Librarian

# EXTENSION ACTIVITIES

Exhibitions of educational, cultural and topical interest are held periodically in the Exhibition room of the Colombo Public Library as part of the extention activities. 11 Exhibitions have been held since January 1981, namely;

1. Exhibition of posters on Johannes Gutenberg "The art of printing transforms the world".

2. Exhibition of sculpture by the German sculptor Hans Kastler.

3. An exhibition of books, gramaphone records, and children's handicrafts.

4. Exhibition of Japanese furoshiki, masks, dolls, fans, etc.

5. Exhibition of Indian paintings, sculpture, textiles, brass ware, jewellery, antiques etc.

6. Exhibition of books, pamphlets, and newspaper articles on "50 years of adult franchise in Sri Lanka".

7. Exhibition of books, and periodicals on "Selected topics in librarianship and information science.

8. Exhibition of Tibetan religious and cultural objects.

9. Exhibition of the services available for the visually handicapped.

10. An exhibition of paintings and drawings by Miss. Yangzom Ros.

11. Exhibition of books and periodicals on public health and safety.

At present, some of the 98 gramaphone records presented to the Library by Mr. Richard C. Schoonover, public Affairs Officer of the United States International Communication Agency on 17th September 1981 are on view in the Exhibition Room. The rest are made available for listening in the Audio-visual Section. The theme of this collection is "The history of America through music".and comprises both classical and modern American music.

## LECTURES

Lectures have been provided for the patrons of the Library free of charge on various topics such as "transcendental meditation", "psychology",etc.

A series of lectures on relaxation, concentration, etc for the development of the community are now being conducted by an international cultural institution for human development, known as "The Community". These lectures are held by competent lecturers in Sinhala and English. Lectures are conducted in English on Tuesdays from 6 00 p.m to 7.00 p.m, and Sinhala on Thursdays from 5 00 p.m to 6.00 p.m, at the Conference Hall.

## CHILDREN'S PROGRAMMES

Stoy telling, handicraft sessions, drawing and painting, a children's stamp club and stamp bank for exchanging extra stamps, video shows, are some of the special programmes arranged for children. The days and times on which they are held are advertised on the notice board of the children's sections of the Library.

Similar programmes are held at the children's section of the Kirillapona Branch Library.

## LIBRARY PUBLICATIONS

1. Ceyloniana: in commemoration of Local Government Week, 1970.

2. Libraries and People: Colombo Public Library 1925-1975, edited by Ishvari Corea. 1975. Rs 20/-

3. 50 Years Commemorative souvenir: 1925-1975.

4. A Manual for Public Librarians in Sri Lanka by Ishvari Corea. 1981 Rs 30/-

5. Roads to Wisdom: a Celebratory volume on the occasion of the opening of the Colombo Public Library New Building on 17th December 1980, edited by Ishvari Corea 1980. Rs 40/-

6. Commemorative souvenir: Opening of the Public Library New Building. 1980 Rs. 2/-

7 Tissamaharama and it's environs: a Bibilography in Commemoration of Gam Udawa '81. 1981.

# සාහිත්‍ය උළෙලක්

ර/උඩුවෙල විද්‍යාලයේ විදුහල්පති පී.බී. රත්නායක මහතා සහ පාසල් සංවර්ධන සමිතියේ මෙහෙයවීම පරිදි පසුගිය සැප්තැම්බර් මස දෙදිනක සාහිත්‍ය උළෙලක් ඕපනායකදී පවත්වන්නට යෙදිණි.

මෙහිදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් රුපියල් දහසක් වටිනා ඉතා අගනා පොත් ප්‍රදානයක් පුස්තකාල සේවා පිළිබඳ සහකාර අධ්‍යක්ෂිකා නාලිනි ද සිල්වා මෙනවිය විසින් ප්‍රදානය කරන්නට යෙදිණි.

පාසල් පුස්තකාලයක් ආරම්භ කිරීමේ පරමාර්ථයෙන් ආදි ශිෂ්‍යයන්ගේ පරිත්‍යාග සහ ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ගේද, දෙමාපිය වැඩිහිටියන්ගේද පරිත්‍යාගද රැස් කර ගැනීමට කටයුතු යොදා තිබීම මෙම සාහිත්‍ය උළෙලේ විශේෂ කරුණක් විය.


ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් දෙසැම්බර් මස, දෙහිවල ගාලු පාරේ, අංක 3 ඒ, දරණ ස්ථානයේ පිහිටි නවමග මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.